## අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව
## හම්බන්තොට දිස්ත්‍රික්කය

-----------------------------------------

**1 මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 13 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ කල්පිත කුලී ආදායම් හා සභා අරමුදලින් මාර්ග ඉදිකිරීමේ වියදම රු. 266,380 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වර්ග තුනකට අයත් තොග ශේෂවල එකතුව රු. 98,818 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු. 87,454 ක් හා යන්ත්‍රෝපකරණ වටිනාකම රු. 3,848 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයවිය යුතු රු. 222,259 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ගිණුම් විෂයයන් 02 ක ශේෂ සහ ඊට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛන වල දැක්වෙන ශේෂ අතර, වර්ෂ ගණනාවක සිට පැවත එන අසමානතාවල එකතුව රු. 59,060 ක් විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) ලැබිය යුතු ගිණුම්**

--------------------

i. වර්ෂ ගණනාවක සිට ගිණුම් වල ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු. 1,049,368 ක් වූ නොපියවූ අත්තිකාරම් ශේෂ 28 ක් නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

ii. නිරවුල් නොවූ ගනුදෙනු ලෙස වර්ෂ ගණනාවක සිට මූලා ප්‍රකාශන වලින් ඉදිරියට ගෙනෙමින් පවතින රු. 10,240 ක ශේෂය නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

iii. පළාත් නිශ්චිත හා පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් නගා සිටුවීමේ ප්‍රාග්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළව සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු එකතුව රු. 3,149,934 ක් නිරවුල් කර ගෙන නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

--------------------

i. 2013 වර්ෂයේ සිට රඳවාගෙන ඇති රු. 516,079 ක ජාතිය ගොඩනැගීමේ බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

ii. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත 2015, 2016 වර්ෂ සඳහා ගෙවිය යුතු පිළිවෙලින් රු. 12,300 ක් හා රු. 14,400 ක් සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් කර නොතිබුණි.

iii. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ඉටුකළ කර්මාන්ත හා පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් නගා සිටුවීමේ වැඩසටහන වෙනුවෙන් එකතුව රු. 3,149,934 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගෙවිය යුතුව පැවතුණි.

iv. දේශීය ණය සහ සංවර්ධන අරමුදලට 2015 වර්ෂය සඳහා ගෙවිය යුතුරු. 728,243 ක පොලිය හා රු. 697,784 ක ණය මුදල්ද, 2016 වර්ෂයට ගෙවිය යුතු රු. 1,175,159 ක පොලිය හා රු. 1,269,459 ක ණයමුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙවා නොතිබුණි.

v. 2016 දෙසැම්බර් 31 දිනට සභාවේ බේරුම් නොකළ බැරකම් වල මුළු වටිනාකම රු. 11,054,878 ක් වූ අතර, ඉන් රු. 773,148 ක් වූ බැරකම් ඉකුත් වර්ෂවලට අදාළ ඒවා විය. එකී ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

එකතුව රු. 95,009,946 ක් වූ ඉඩම් ගොඩනැගිලි හා පොදු උපකරණ සම්බන්ධයෙන් යාවත්කාලීන කළ ලේඛනය හා උපලේඛනද, එකතුව රු. 7,094,309 ක් වූ තැන්පත් වර්ග 05 ක් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛනද, ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන හා පරිපූරක සම්මත සමඟ සසඳා එක් එක් ආදායම් විෂයයන් හා වැය විෂයයන් යටතේ වන අතිරික්තයන් හෝ ඌණතාවන් පිළිබඳ කරුණු පැහැදිලි කරන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. මුදල් රෙගුලාසි 371(2), (5) | අවස්ථා හතරකදී ලබාදී තිබුණු රු. 7,795 ක අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 396(ඇ) | නිකුත් කර මාස 06 ක කාලයක් ඉක්මවූ එකතුව රු. 13,377 ක් වූ චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය පරිදි කටයුතු කර නොතිබුණි. |
| iii. මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත්වූ රු. 1,586,690 ක් වටිනා තැන්පත් ශේෂ 181 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2010 අගෝස්තු 17 දිනැති හා පීඊ/01/01 අංක දරන විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් වීථි පහන් 2,070 ක් නඩත්තු කර තිබූ නමුත්, ඉන් වීථි පහන් 1,720 ක් සඳහා ගාස්තු ප්‍රතිපූර්ණය කර නොතිබුණි. |
| (ඈ) 2014 ඔක්තෝබර් 15 දිනැති හා අංක 03/2014 දරන දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛයේ 07 වන ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා කර්මාන්ත ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) 2014 පෙබරවාරි 24 දිනැති හා 01/2014 අංක දරන දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛය | සේවකයන් 12 දෙනෙකුගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ඊ) 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PFD/RED/2015/08 පොදු (i) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 4.3 (අ) සහ 4.3 (ඉ) වගන්ති | සභාවේ සේවයේ නියුතුව සිට 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 141,016 ක ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.5,331,307 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 2,907,705 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 2,423,602 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

(ආ) වැඩසටහන් අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම් හා වියදම් සසඳා බැලීමේදී වැඩසටහන් 05 න් වැඩසටහන් 04 ක එකතුව රු. 1,067,888 ක් වූ ආදායම් ඉක්මවූ වියදම් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 87 ක් තරම් ඉහළ අගයක පුනරාවර්තන වියදම් පැවති අතර, එය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොවන බව පෙන්නුම් කෙරුණි.

(ආ) සෑම වර්ෂයකදීම මෙන්ම සභාවේ පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් වැඩිවී ඇති බවද, ස්වයං උත්පාදන ආදායම් ප්‍රමාණය ඉක්මවා සැලකිය යුතු අගයන්ගෙන් පුනරාවර්තන වියදම් අඛණ්ඩ වැඩිවී ඇති බවද, ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් කිසිදු ආකාරයකින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි බවද පෙන්නුම් කෙරුණි. වියදම් පාලනය කර අවම මට්ටමකින් පවත්වාගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

----------------------

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට සභාවේ ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බිල් කළ ආදායම රු. මිලියන 16.6 ක් වූ අතර, ඉන් රු.මිලියන 13.2 ක් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 80 ක් පමණ විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබිය යුතු ආදායම් ශේෂවල එකතුව රු. මිලියන 2.2 ක් වූ අතර, ඉන් රු. මිලියන 0.8 ක් අයවී තිබුණි. ඒ අනුව හිඟ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සියයට 36 ක් පමණ විය.

### 2.3.2 වරිපනම් බදු

-------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියට අනුකූලව වරිපනම් බදු පනවා අයකර ගැනීමට 2017 ජුනි 30 දක්වාම අපොහොසත් වී තිබුණි.

### 2.3.3 බදුකුලී

-------

2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 06 වන ඡේදයට අනුකූලව වසර පහකට වරක්වත් කඩ කාමර තක්සේරු කර බදු කුලිය සංශෝධනය කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. අඟුණකොළපැලැස්ස කඩ කාමර 10 ක්, තක්සේරු කර නොතිබුණු අතර, දෙබොක්කාව කඩ කාමර 04 ක් 2007 මාර්තු 20 දින අවසන් වරට තක්සේරු කර තිබුණි.

### 2.3.4 බලපත්‍ර ගාස්තු

---------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 59 අනුව කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර සම්බන්ධයෙන් සමීක්ෂණයක් කර නොතිබුණි.

(ආ) ආරම්භක හිඟ ශේෂය රු. 95,065 ක් වූ අතර, වර්ෂය සඳහා බිල් කිරීම් රු. 928,786 ක් සමඟ රු. 1,023,851 ක් අයවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ මුළු අයවීම් රු. 933,911 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු. 89,940 ක් හිඟව පැවතුණි. ආරම්භක හිඟ ශේෂයෙන් සියයට 05 තරම් පහළ අගයක් අයකර ගෙන තිබුණි.

**2.3.5 වෙනත් ආදායම්**
**-----------------**

සභාවට අයත් යන්ත්‍රෝපකරණ සේවයේ යෙදවීම මත 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු ආදායම රු. 542,046 ක් වූ අතර, එම ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මෙම හිඟ ආදායම් තුළ 2013 සිට 2015 දක්වා වර්ෂ වලට අදාළ රු. 268,046 ක්වූ හිඟ ශේෂ ඇතුළත් වී තිබුණි.

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**
**-----------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,134,071 ක් ද, මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 70,720 ක් ද ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**
**----------------------------**

**3.1 වාහන පාලනය**
**----------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ)** සභාවේ ඩම්ප් ට්‍රක් රථයට 2016 දෙසැම්බර් 22 දින සිදුවූ අනතුර සම්බන්ධයෙන්,ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 103 (අ), (ආ) ප්‍රකාරව අදාළ බලධාරින් වෙත වාර්තාකර නොතිබූ අතර, අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1)ට අනුව පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.

**(ආ) වාහන රක්ෂණ**
**----------------**

2015 ජූලි 14 දිනැති අංක 04/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව රක්ෂණ සේවාව සෘජුවම ලබාගැනීමට කටයුතු නොකර, රක්ෂණ නියෝජිතයකු මගින් සභාවේ වාහන 06 ක් සඳහා රු. 272,090 ක රක්ෂණාවරණ ලබාගෙන තිබුණි.

**3.2 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්**
**------------------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නිෂ්ක්‍රීය තත්ත්වයේ පවතින වාහන 04 ක් අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) යෝජිත ආදාහනාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2016 ජූලි 14 දින නිම වී තිබූ අතර, ඒ සඳහා ඉදිකිරීම් ආයතනය වෙත රු. 4,868,324 ක මුදලක් ගෙවා තිබුණි. ආදාහනාගාරයට අවශ්‍ය උපාංග සපයා සවි නොකිරීම මත 2017 ජුනි 30 දින වන විටත් ගොඩනැගිල්ල නිෂ්ක්‍රීයව පවතින බව පෙන්නුම් කෙරුණි.

(ඇ) සභාවට අයත් අන්තර් සම්බන්ධිත කුට්ටිගල් යන්ත්‍රය 2016 වර්ෂය පුරාම කුට්ටිගල් සෑදීමේ කාර්ය සඳහා යොදා ගැනීමට හෝ බාහිර පාර්ශවයන් වෙත කුලියට/බද්දට ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) රු. 57,293 ක් වටිනා නළ ළිං උපකරණ තොගය දීර්ඝ කාලයක සිට නිෂ්ක්‍රීයව පවතින අතර, ඒවා ප්‍රයෝජනවත් කාර්යයකට යොදා ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

## 3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

සභාව විසින් කසළ කළමනාකරණය පිළිබඳව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරනොතිබූ අතර, සමස්ථ බල ප්‍රදේශයම ආවරණය වන පරිදි කසළ රැස්කර බැහැර කිරීමේ සේවාව පවත්වා නොතිබුණි. කසළ කළමනාකරණ වියදම් ආවරණය කර ගැනීම සඳහා කසළ බදු පනවා නොතිබුණි.

## 3.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරු 06 ක පුරප්පාඩු 06 ක් පැවතුණු අතර, තවත් තනතුරු 05 ක අතිරික්ත සේවක සංඛ්‍යාව 06 ක් විය. පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට සහ අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 මැයි 11 සිට අගෝස්තු 18 දක්වා සභාවේ ආදායම් පරීක්ෂක නොදන්වා සේවයට නොපැමිණීම හා ඉහත පළමු දින සිට 2017 ජනවාරි 16 දක්වා අනුමැතියකින් තොරව නිවාඩු ලබාගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කර නොතිබූ අතර, එම නිලධාරියා සේවයට නොපැමිණි මාස තුනක කාලයක් සඳහා රු. 94,082 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි. මෙම මුදල් 2017 ජුනි 30 දින වන විටත් සභාව වෙත අයකරගෙන නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 36 ක් සඳහා අයවැය ලේඛනය මගින් සලසා තිබූ එකතුව රු. 2,626,000 ක මුළු ප්‍රතිපාදනයම වර්ෂය අවසානයට ඉතිරි කර තිබූ අතර, වැය විෂයයන් 55 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු. 8,251,943 ක ඉතිරිකිරීම් නිරීක්ෂණය විය. තවද ආදායම් විෂයයන් 03 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 3,702,107 ක් විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

------------------

පහත දැක්වෙන පද්ධති  හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් පරිපාලනය

(ඈ) අයවැය පාලනය

(ඉ) පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම